අග්‍රාමාත්‍ය කාර්යාලය

பிரதம அமைச்சர் அலுவலகம்

Prime Minister's Office



# කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

# 2012

# අපගේ දැක්ම

ස්වාධීන, ස්වෛරී හා
සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක්

# අපගේ මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල
ගැන්වීම පිණිසත්,
ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම පිණිසත්,
රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර මනා
සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්,
යහ පාලනයෙන් යුත් විශිෂ්ට රාජ්‍ය
යාන්ත්‍රණයක් උදෙසා අවැසි නායකත්වයක් සැපයීම.

# පටුන

1. වගකීම් සහ කාර්යභාරය

2. අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහය

3. අග්‍රාමාත්‍ය කාර්යාලයේ පරිපාලන ව්‍යුහය

4. අග්‍රාමාත්‍ය කාර්යාලය - කාර්ය මණ්ඩලය

5. ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන්

   i. මහින්ද චින්තන ඉදිරි දැක්ම ජාතික ප්‍රතිපත්තියට සමගාමීව ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක වන ''ආර්ථික සංවර්ධනයත් සමග උත්තරීතර සමාජයක් උදෙසා ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ'' වැඩසටහන

   ii. 2008 වසරේ සිට ක්‍රියාත්මක වන ඵලදායිතා සංවර්ධන වැඩ සටහන

   iii. දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමී වැඩ සටහන්

   iv. 2008 වසරේ සිට පුරවැසි සේවා ප්‍රඥප්තියක් තුළින් සමාජ සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම හා සේවා සැපයීම කාර්යක්ෂම කිරීම

   v. 2008 – 2015 සාක් සමාජ ප්‍රඥප්තිය හා සම්බන්ධ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධිකරණය කිරීම

6. ගරු අග්‍රාමාත්‍යතුමා නිරත වූ විදේශීය සංචාර, රාජ්‍ය තාන්ත්‍රිකයන් හමුවීම/සාකච්ජා/ගිවිසුම්

7. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා රාජ්‍ය නිලධාරින්ට සමුළු/ සම්මන්ත්‍රණ/ වැඩමුළු/ශිෂ්‍යත්ව සඳහා දිවයිනෙන් බැහැරව යාමට අනුමැතිය ලබාදීම

8. අමාත්‍ය මණ්ඩල සංදේශ, පාර්ලිමේන්තු වාර්තා හා පනත් කෙටුම්පත් ආදිය පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම

9. තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන ප්‍රවර්ධනය

10. මානව සම්පත් සංවර්ධනය


11. 2012 වසර සඳහා වියදම් වාර්තාව

## 1) වගකීම් සහ කාර්යභාරය

අග්‍රාමාත්‍ය කාර්යාලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිල රාජකාරි කටයුතු ක්‍රියාත්මක කරන ආයතනයයි. එමගින් ඉටුවන කටයුතු පහත සඳහන් පරිදි වර්ග කර දැක්විය හැකිය.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවාව තුළ දෙවන ප්‍රධානතම කාර්යාලය වශයෙන් අනෙකුත් සියලුම රාජ්‍ය ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම් ලබාදීම.
- ගරු අග්‍රාමාත්‍යතුමා මුලසුන හොබවන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය
- රාජ්‍ය අංශය සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ගනිමින් මහජනතාවට ප්‍රශස්ත සේවාවක් සැපයීම
- ගරු අග්‍රාමාත්‍යතුමා හට විදේශ දූත මණ්ඩල, විදේශ තානාපති සේවයේ නිලධාරීන් සමග සම්බන්ධතා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සළසා දීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීම, රජයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාවට නැංවීමට පූර්ණ සහය ලබාදිම.
- ගරු අග්‍රාමාත්‍යතුමා මගින් යොමු කරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත්වලට සම්බන්ධ කටයුතු ඉටු කිරිම.
- දකුණු ආසියාතික කලාපයේ සමාජ ප්‍රඥප්තියේ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධ කටයුතු නියාමනය කිරිම හා පසු විපරම් කිරිම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා රාජ්‍ය නිලධාරින්හට විවිධ කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යාම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවසරය ලබාදීම.
- ගරු අග්‍රාමාත්‍යතුමාගේ විදේශ සංචාර සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම.
- ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගීවන රාජ්‍ය හා ජාතික උත්සව සහ විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය ආවරණ කටයුතු ඉටු කිරිම.
- අග්‍රාමාත්‍ය කාර්යාලයට අදළ පරිපාලන හා සංවර්ධන කටයුතු ඉටු කිරිම.
- නිලධාරින් පුහුණු කිරිම හා දිරි ගැන්වීමේ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරිම.
- අග්‍රාමාත්‍ය කාර්යාලය, ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිල නිවාස සහ සංචාරක බංගලා ආදියේ නඩත්තු කටයුතු
- විවිධ සමාජ සත්කාරක සේවාවන් සඳහා අවශ්‍ය දයකත්වය ලබාදීම.
- ආර්ථික සංවර්ධනයත් සමග උත්තරීතර සමාජයක් උදෙසා ශ්‍රී ලාංකේය ජනසමාජය තුළ යහපත් ආකල්ප වර්ධනය කිරිමේ වැඩසටහන ක්‍රියාත්මක කිරිම.

# අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන සටහන



## 3) අග්‍රාමාත්‍ය කාර්යාලයේ පරිපාලන ව්‍යුහය

- ගරු අග්‍රාමාත්‍යතුමාගේ කාර්යාලය
- අග්‍රාමාත්‍ය පෞද්ගලික කාර්ය මණ්ඩලය
- අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
- අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් කාර්යාලය
- පාලන අංශය
- ගිණුම් අංශය
- සංවර්ධන අංශය
- මාධ්‍ය අංශය
- සැපයුම් හා ගබඩා අංශය
- ප්‍රවාහන අංශය
- ආරක්ෂක අංශය

## 4) අග්‍රාමාත්‍ය කාර්යාලය - කාර්ය මණ්ඩලය

### ස්ථිර කාර්ය මණ්ඩලය 2012.01.01- 2012.12.31

| අනු අංකය | තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අග්‍රාමාත්‍ය ලේකම් | 1 | 1 | 0 |
| 2 | අතිරේක ලේකම් | 1 | 1 | 0 |
| 3 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 2 | 2 | 0 |
| 4 | සහකාර ලේකම් | 7 | 5 | 2 |
| 5 | ගණකාධිකාරි | 1 | 1 | 0 |
| 6 | ගණකාධිකාරි(අභ්‍යන්තර විගණක) | 1 | 1 | 0 |
| 7 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී ලං.සැ.සේ.) | 1 | 0 | 1 |
| 8 | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 |
| 9 | භාෂා පරිවර්තක | 2 | 2 | 0 |
| 10 | ප්‍රලේඛන නිලධාරි | 1 | 0 | 1 |
| 11 | සන්ධාන නිලධාරී | 1 | 1 | 0 |
| 12 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 42 | 42 | 0 |
| 13 | රූපවාහිනී කැමරාකරු | 1 | 1 | 0 |
| 14 | රූපවාහිනී කාර්මික ශිල්පී | 1 | 0 | 1 |
| 15 | පිළිගැනීමේ නිලධාරි | 1 | 0 | 1 |
| 16 | පොත් බැඳුම්කරු | 1 | 1 | 0 |
| 17 | දුරකථන සේවක | 2 | 2 | 0 |
| 18 | රූපවාහිනී සේවා සහායක | 2 | 2 | 0 |
| 19 | මෝටර් රථ රියදුරු | 26 | 22 | 4 |
| 20 | ප්‍රධාන කා.කා.සහායක | 1 | 1 | 0 |
| 21 | කාර්යාල සේවක සේවය | 34 | 34 | 0 |
| | **එකතුව** | **130** | **120** | **10** |

# පෞද්ගලික කාර්ය මණ්ඩලය
# 2012.01.01 – 2012.12.31

| අනු අංකය | තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | පෞද්ගලික ලේකම් | 1 | 1 | 0 |
| 2 | මහජන සම්බන්ධතා ලේකම් | 1 | 1 | 0 |
| 3 | සම්බන්ධීකරණ ලේකම් | 1 | 1 | 0 |
| 4 | මාධ්‍ය ලේකම් | 1 | 1 | 0 |
| 5 | සම්බන්ධීකරණ ලේකම් (වෘත්තීය සමිති) | 1 | 1 | 0 |
| 6 | සම්බන්ධීකරණ ලේකම් (පාර්.කටයුතු) | 1 | 1 | 0 |
| 7 | පුද්ගලික සහකාර | 1 | 1 | 0 |
| 8 | ලඝු ලේඛක (ඉංග්‍රීසි/දෙමළ) | 2 | 1 | 1 |
| 9 | ලඝු ලේඛක (සිංහල) | 2 | 2 | 0 |
| 10 | යතුරු ලේඛක (සිංහල) | 3 | 1 | 2 |
| 11 | යතුරු ලේඛක (ඉංග්‍රීසි) | 2 | 0 | 2 |
| 12 | ලිපිකරු | 9 | 8 | 1 |
| 13 | රියදුරු | 9 | 9 | 0 |
| 14 | කාර්යාල කාර්ය සහායක | 4 | 3 | 1 |
| | **එකතුව** | **38** | **31** | **7** |

# තාවකාලික කාර්ය මණ්ඩලය
# 2012.01.01 – 2012.12.31

| අනු අංකය | තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | උපදේශක (විදේශ කටයුතු) | 1 | 0 | 1 |
| 2 | උපදේශක (ගරු අග්‍රා. හා ගරු බුද්ධ ශාසන ඇමතිතුමාගේ) | 1 | 1 | 0 |
| 3 | අග්‍රාමාත්‍ය ලේකම්ගේ සම්.ලේකම් | 1 | 1 | 0 |
| 4 | අරලියගහ මන්දිරයේ කළමනාකරු | 1 | 0 | 1 |
| 5 | සමාජ සහකාර | 1 | 1 | 0 |
| 6 | පෞද්ගලික ආරක්‍ෂක | 5 | 5 | 0 |
| 7 | ප්‍රවෘත්ති නිලධාරී | 1 | 0 | 1 |
| 8 | මාධ්‍ය සම්බන්ධීකාරක | 1 | 0 | 1 |
| 9 | ප්‍රවෘත්ති සංස්කාරක | 2 | 2 | 0 |
| 10 | ඡායාරූප ශිල්පී | 1 | 1 | 0 |
| 11 | උපදේශක වෛද්‍ය(අරලියගහ මන්දිරය) | 1 | 0 | 1 |
| 12 | ප්‍රධාන අරක්කැමි | 1 | 0 | 1 |
| 13 | බංගලා භාරකරු* | 3 | 3 | 0 |
| 14 | සහකාර බංගලා භාරකරු | 2 | 2 | 0 |
| 15 | අරක්කැමි (නුවරඑළිය) | 1 | 0 | 1 |
| 16 | නිල නිවාස සහායක | 8 | 8 | 0 |
| 17 | ගෘහ සේවක | 2 | 2 | 0 |
| 18 | සංග්‍රහ කටයුතු සහ ගොඩනැගිලි නඩත්තු භාරකරු | 1 | 0 | 1 |
| 19 | රිය ශෝධක | 2 | 2 | 0 |
|  | **එකතුව** | **36** | **28** | 8 |

## 5) ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති සහ වැඩසටහන්

### (i) ''මහින්ද චින්තන ඉදිරි දැක්ම'' ජාතික ප්‍රතිපත්තියට සමගාමීව ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක වන ආර්ථික සංවර්ධනයත් සමග උත්තරීතර සමාජයක් උදෙසා ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන

**1. හැඳින්වීම**

මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ මූලික සංකල්පය හා අනුගතවෙමින් සීඝ්‍ර ආර්ථික සංවර්ධනයත් සමග සමාජ සංවර්ධනයක අවශ්‍යතාව පැන නැගී ඇත. රට පිටුවහලක් සපයමින් ආර්ථික සංවර්ධනයත් සමග උත්තරීතර සමාජයක් උදෙසා ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන අග්‍රාමාත්‍ය කාර්යාලය මගින් දැනටමත් ආරම්භ කර ඇත. ඒ අනුව විවිධ තේමාවන් මුල් කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

**2. සංකල්පය**

මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් පරිදි මිනිසා භෞතික වශයෙන් පමණක් නොව අධ්‍යාත්මික වශයෙන්ද ගොඩනැගීම සඳහා ශ්‍රද්ධාව මෙන්ම, ප්‍රඥාවද ලබාදිය යුතුය. මේ සඳහා මාපිය-දූදරු, සැමියා-බිරිඳ, ගුරු-සිසු, සේව්‍ය-සේවක, පාලක-පාලිත, ආදි සියලුම සබඳතා යහපත් සහ ඵලදායි ඒවා බවට පත්කර අසහනය හා අවිශ්වාසය හදවත් තුළින් ඉවත් කළ යුතුය. එමගින් ආර්ථික සංවර්ධනයට සමගාමීව සමාජ සංවර්ධනයක් ද ඇති කර සුරක්ෂිත සමාජයක් රට තුළ ගොඩනැගීම අපේක්ෂා කෙරේ.

**3. ජාතික වැඩසටහනේ අරමුණු**

1. ජාතිකාභිමානීය හැඟීම් ගොඩ නැංවීම.
2. පරිසරය සමග සහජීවනයෙන් කටයුතු කිරීම.
3. ස්වයං විනයක් සහිත සමාජයක් බිහිකිරීම

## 4. යහපත් ආකල්ප වර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්

- දැයට කිරුළ ප්‍රදර්ශනය හා සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර යහපත් ආකල්ප වර්ධනය කිරීම යන තේමාව යටතේ රචනා හා චිත්‍ර තරගයක් පවත්වන ලදී.

- ''පිරිසිදුකම නිරතුරු - රකිනු මැන සුමිතුරු'' යන තේමාව මුලික කරගෙන පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර පිරිසිදුකම පවත්වා ගැනීම පිළිබඳ වැඩසටහන් මාලාවක් දියත් කෙරුණි.

- යහපත් ආකල්ප නංවාලීමේ අරමුණු පෙරදැරිව කොටස් 12 කින් යුත් ඒකාංගික රූපවාහිනි ටෙලිනාට්‍ය මාලාවක් ''පියගැටපෙළ'' නමින් නිර්මාණය කර ඇත. මේ වන විට එය ස්වාධීන රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශනය වේ.

- සිරිත් මල්දම් කාව්‍ය සංග්‍රහය රූප කාව්‍යක් ලෙස සංයුක්ත තැටියක් නිර්මාණය කර ලංකාවේ සියළුම පාසල් සඳහා නොමිලේ බෙදා දී ඇත. ඉදිරියේ දී මේ සම්බන්ධ විවිධ වැඩසටහන් දියත් කිරීමට බලාපොරොත්තු වේ.

- රූපවාහිනීය මාධ්‍ය ඔස්සේ කෙටි රූප රාමු (Video Clips) මගින් යහපත් ආකල්ප වර්ධනය කිරීමේ පණිවිඩ මහජනතාවට ලබා දීමේ වැඩසටහනක් සකස් කරන ලදී.

- යහපත් හිතත් - සව්මත් රටක් යන තේමාව ඔස්සේ ජීවිතය එක් එක් අවධීන් හිදී යහපත් ක්‍රියාදමයන් අනුගමනය කිරීමෙන් සාර්ථක යහපත් පුරවැසියකු වන්නේ කෙසේ ද යන්න පිළිබඳව ප්‍රවීණ ලේඛක සෝමවීර සේනානායක මහතා විසින් රචනා කර අග්‍රාමාත්‍ය කාර්යාලය මගින් පල කිරීමට කටයුතු යොදා ඇත.

- බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ප්‍රදේශයේ දුෂ්කර පාසැල් හඳුනාගෙන එම සිසු සිසුවියන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කල අතර එම දරු දැරියන් සහ ගුරුවරුන් වෙනුවෙන් පාසල් උපකරණ සහ ශබ්ද කෝෂ ඇතුළු වටිනා පොත් පත් පරිත්‍යාග කරන ලදී.

- යහපත් සිතක් - සව්මත් රටක් යන තේමාව ඔස්සේ ශ්‍රී ලාංකේය ජන සමාජය තුල සාර ධර්ම, ස්වයං විනය, ජාත්‍යානුරාගය සහ පරිසර හිතකාමී බව වර්ධනය කිරීම පිණිස මා පිය – දූ දරු, සැමියා - බිරිඳ, ගුරු - සිසු, සේව්‍ය - සේවක සහ පාලක - පාලිත ආදී කොට ඇති සියළු දෙනාටම ආදර්ශ සපයන පුවත්පත් වැඩසටහන් 2012 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කිරීම. මෙම පුවත්පත් කාටූන්

දිනපතා දිනමිණ, දිවයින, ලක්බිම, ලංකාදීප, තිනකුරල් සහ තිනකරන් යන පුවත්පත් වල පල කෙරේ.

- සෝමවීර සේනානායක මහතා විසින් රචිත යහපත් සිතක් - සවිමත් රටක යන සිංහල මාධ්‍යයෙන් සම්පාදිත ග්‍රන්තයේ පළමු මුද්‍රණය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මාධ්‍ය ආයතන වෙත බෙදහරින ලදී.

- කුඩා දරුවන් සඳහා යහපත් දිවියකට අත්වැල සපයන ළමා අත්පොතක් සිබිල් වෙත්තසිංහ මහත්මිය මගින් ලියා පල කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

- යහපත් සිතක් - සවිමත් රටක් යන තේමාව යටතේ සෝමවීර සේනානායක මහතා විසින් රචිත කෘතියෙහි දෙමළ භාෂා අනුවර්තනය ආරම්භ කරන ලදී.

## (ii) 2008 වසරේ සිට ක්‍රියාත්මක වන අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඵලදායිතා සංවර්ධන වැඩ සටහන 2012 වසරේදී තවදුරටත් ක්‍රියාත්මක කෙරිණි.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද ඵලදායිතා සම්මාන – 2009 තරගාවලියේ රාජ්‍ය අංශයේ අන්තර් අමාත්‍යාංශ කාණ්ඩය යටතේ ඉදිරිපත් වී විශේෂ කුසලතා සම්මාන සහතිකයක් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් දිනා ගැනීමෙන් අනතුරුව ඊළඟ පියවර වශයෙන් 2013 වර්ෂයේදී ඵලදායිතා ස්වර්ණ සම්මානය ලබා ගැනීම ඉලක්ක කර ගනිමින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

1. ආයතනයේ දැක්ම හා මෙහෙවර පදනම් කර ගනිමින්, එහි අගයන් අවබෝධ කර ගත් කාර්ය මණ්ඩලයත් සමග වැඩසටහන් ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

2. තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් දැනට ක්‍රියාත්මක ක්‍රියාදමයන් යථාවත් කිරීමට හා කාර්යක්ෂම කිරීමට කටයුතු කෙරේ.

3. කාර්ය මණ්ඩලය තුළ ආකල්පමය වෙනසක් ඇති කොට ඒ තුළින් කාර්යාල පරිසරය හා බාහිර සබඳතා ඉහල මට්ටමකට ගෙනවිත් තිබේ.

4. කාර්යාලය තුළ වැඩමුළු පැවැත්වීම මගින් තත්ත්ව කව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම හා ශිල්ප ක්‍රම පිළිබඳ දැනුමක් ලබා දී ඇත.

5. කාර්ය මණ්ඩලය සඳහා ඵලදායිතා පුහුණු අවශ්‍යතා සලසා දෙනු ලැබ ඇත.

## (iii) දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමී වැඩසටහන්

වාර්ෂිකව ජාතික නිදහස් දිනට සමගාමීව පැවැත්වෙන දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය 2012 පෙබරවාරි මස මුල් භාගයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ දී පැවැත් විය. ඒ අනුව, මෙම ප්‍රදර්ශනයට අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රදර්ශන මණ්ඩපය නිර්මාණය කිරීම හා විවිධ වැඩසටහන් දියත් කෙරිණි.

තවද, 2012 වර්ෂයේ දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය මුල් කරගෙන යහපත් ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් අනුරාධපුර දිසත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් පාසැල් ළමුන් අතර රචනා හා චිත්‍ර තරග පවත්වා දැයට කිරුළ ප්‍රදර්ශන උත්සවයේ දී ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ජයග්‍රාහක දරු දැරියන් වෙත තෑගි සහ සහතික පත් ප්‍රදානය කෙරිණි.

## (iv) 2008 වසරේ සිට පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තියක් තුළින් සමාජ සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම හා සේවා සැපයීම කාර්යක්ෂම කිරීම

**අරමුණ**

- මේ තුළින් රාජ්‍ය සේවාවන් සැපයෙන ක්‍රමයන්හි ගුණාත්මක බව අඛණ්ඩව ඉහළ නැංවීම.
- සැපයෙන සේවාවන්ගේ ප්‍රමිතීන් පිළිබඳව හා එම ප්‍රමිතීන් අනුව සේවා සම්පාදනය නොවන්නේ නම් පුරවැසියන්/සේවාලාභීන් විසින් ගනු ලැබිය හැකි ක්‍රියාමාර්ගයන් පිළිබඳව එකඟත්වයකට එළඹීම.
- ගෙවන බදු මුදල් වෙනුවෙන් පුරවැසියන්/සේවාලාභීන් සඳහා ගුණාත්මක හා කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා වන සදචාරාත්මක බැඳීම තහවුරු කිරීම.
- සපයනු ලබන සේවාවන් විෂයයෙහි රාජ්‍ය සේවකයින්ගේ වගකීම තහවුරු කිරීම.
- නීති රෙගුලාසි හා ක්‍රමවේදයන් පිළිබඳ සේවාලාභීන් තුළ වඩා දැනුවත් භාවයක් ඇති කිරීම
- පුරවැසියන්/සේවාලාභීන් තම සේවය ඉටු කර ගැනීමේ දී දත යුතු කරුණු පිළිබඳව අවබෝධයක් ඇති කිරීම.

## (v) 2008 - 2015 සාක් සමාජ ප්‍රඥප්තිය හා සම්බන්ධ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධීකරණය කිරීම.

- දකුණු ආසියාවේ වෙසෙන ජනතාවගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම තුළින් ජීවන තත්ත්වය නැංවීම අරමුණු කොට ඇති සාක් සමාජ ප්‍රඥප්තිය අනුව එහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. එහි පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීමට අදාළ රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධීකරණය අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් කරනු ලැබේ. නියමිත කාලසීමාවක් තුළ සපුරාගත යුතු නිශ්චිත අරමුණු සහ ඉලක්ක සමග ශ්‍රී ලංකාවට බෙහෙවින් අදාළ වන සාක් සමාජ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම මෙහි අරමුණ වේ.

- 2008 - 2015 ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කරුණු තුළින් පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කෙරේ.

  1. දිළිඳුකම
  2. තරුණයන්
  3. කාන්තාවන්
  4. ළමයින්
  5. අධ්‍යාපනය

- මෙම ප්‍රධාන අංශයන්ට අදාළ අමාත්‍යාංශ සමග මනා සම්බන්ධීකරණයක් ඇති කරගනිමින් ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කරුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබේ.
- ක්‍රියාකාරී සැලැස්ම වඩාත් පහසුවෙන් අධ්‍යනය කිරීම සඳහා එහි අන්තර්ගත ප්‍රගති සමාලෝචන අංග ප්‍රතිශෝධනය කරන ලදී.

# 6) ගරු අග්‍රාමාත්‍යතුමා නිරත වූ විදේශීය සංචාර, රාජ්‍ය තාන්ත්‍රිකයින් හමුවීම/සාකච්ඡා/ගිවිසුම් පිළිබඳ විස්තර

විදේශ සංචාර - නැත

**ගරු අග්‍රාමාත්‍යතුමා හමුවීමට පැමිණි රාජ්‍ය තාන්ත්‍රිකයින් පිළිබඳ විස්තර**

**2012.01.01 - 2012.12.31**

| දිනය | විදේශීය රාජ්‍ය නියෝජිතයාගේ නම | රට |
|---|---|---|
| 2012.01.14 | ඉරානයේ තානාපති අතිගරු මොහොමඩ් නබි හසානි පූර් | ඉරානය |
| 2012.01.17 | ඉන්දියානු විදේශ කටයුතු අමාත්‍ය ගරු එස්.එම්. ක්‍රිෂ්ණා ඇතුළු නියෝජිත කණ්ඩායම | ඉන්දියාව |
| 2012.01.21 | රුසියාව සඳහා ශ්‍රී ලංකා තානාපති පත්වීම් ලද එස්.එස්. ගනේගම ආරච්චි මහතා | ශ්‍රී ලංකාව |
| 2012.02.02 | සයිප්‍රසයේ තානාපති අතිගරු නෆ්සිකා කොඋස්ට් | සයිප්‍රස් |
| 2012.02.14 | පිළිපීනයේ ශ්‍රී ලංකා තනාපති අතිගරු නාවලගේ බැනට් කුරේ ඇතුළු නියෝජිත කණ්ඩායම. | පිලිපීනය |
| 2012.02.14 | පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සමුළු විධායක කමිටුවේ සභාපති පාර්ලිමේන්තු නියෝජිත අතිගරු ශ්‍රීමත් ඇලන්හැසල්හර්ට් සහ පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ මහලේකම් ආචාර්ය විලියම් එෆ්. ෂිජා | පොදු රාජ්‍ය මණ්ඩලය |
| 2012.03.06 | ඉන්දියාවේ මුස්ලිම් වරුන්ගේ අති උතුම් පුජක තැන්පත් මෞලවි ඒ.පී. අබුබකර් තුමාණන් | ඉන්දියාව |
| 2012.04.25 | තායිලන්තයේ තානාපති අතිගරු පොල්දෙජ් වොරාචට් මහතා. | තායිලන්තය |
| 2012.04.27 | වර්ල්ඩ් පෝරම් ෆෝ ප්‍රොක්සිමිටි ඔෆ් ඉස්ලාමික් ස්කූල් ඔෆ් තෝට් හි මහලේකම් ගරු අයටොල්ලා මහමුඩ් අලි ටෂ්කිරි | ඉරානය |
| 2012.07.25 | රුසියාවේ තානාපති අතිගරු විලඩිමීර් පී. මිකෙලව් මහතා. | රුසියාව |

**<u>රැස්වීම් :</u>**

| දිනය | විදේශ නියෝජිතයාගේ නම | රට |
|---|---|---|
| 2012.01.16 | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලින් කටාර් රාජ්‍යයේ එමීර්වරයා වන අතිගරු ෂික් හමාඩ් බින් කාලිෆා අල්තානි නික්මයාම වෙනුවෙන් පවත්වන ලද උත්තමාචාරයට සහභාගි වීම. | කටාර් |

## 7) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා රාජ්‍ය නිලධාරීන්ට සමුළු/සම්මන්ත්‍රණ/වැඩමුළු/ශිෂ්‍යත්ව සඳහා දිවයිනෙන් බැහැරව යාමට අනුමැතිය ලබාදීම

❖ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ රජයේ ආයතනවල මාණ්ඩලික නිලධාරීන් විදේශ ගතවීම් වලදී රටින් බැහැරව යාම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2007 ප්‍රකාරව ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගත යුතුය.

❖ 2012.01.01 - 2012.12.31 දින දක්වා නිලධාරීන් **5112** දෙනෙකු හට රටින් බැහැරව යාමට අනුමැතිය ලබා දී ඇත.

❖ දිනකට අයදුම්පත් සැලකිය යුතු ප්‍රමාණයක් ලැබෙන අතර ඒ සම්බන්ධව කටයුතු කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් යොදා ඇත.

❖ මේ සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් වරින් වර නිකුත් කර ඇති උපදෙස් අනුව රජයේ ආයතන සමග මෙය විධිමත්ව ක්‍රියාත්මක කිරීම පිණිස අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් වරින් වර උපදෙස් නිකුත් කරනු ලැබේ. එමෙන්ම තොරතුරු ඉදිරිපත් කිරීමේ පෝරම ආදිය යථා පරිදි සකස් කොට ප්‍රමාදයකින් තොරව මෙම කටයුත්ත අදාළ නිලධාරීන් වෙත ඉටුකර දීමට කටයුතු යොදා ඇත.


❖ ඉදිරියේදී තොරතුරු තාක්ෂණ ක්‍රම උපයෝගී කරගනිමින් අයදුම්පත් ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලබාදීමට අපේක්ෂිත අතර, එම කාර්යයන් පරිගණක ජාලය මගින් ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

❖ එම තොරතුරු වගුවක් හා ප්‍රස්ථාරයක් ආශ්‍රයෙන් පහත දක්වා ඇත.

# අනුමැතිය ලබාදුන් විදේශ නිවාඩු පිළිබඳ සාරාංශය ( 2012.01.01 - 2012.12.31 )

| අනු අංකය | අමාත්‍යාංශය | අනුමැතිය ලබාදුන් නිලධාරීන් සංඛ්‍යාව | |
|---|---|---|---|
| 1 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 1654 | |
| 2 | විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය | 414 | |
| 3 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 297 | |
| 4 | පරිසර අමාත්‍යාංශය | 191 | |
| 5 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 178 | |
| 6 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 184 | |
| 7 | ජලසම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය | 132 | |
| 8 | ප්‍රවාහන අමාත්‍යාංශය | 141 | |
| 9 | වරාය මාර්ග හා ජලකළමනාකරණ අමාත්‍යාංශය | 126 | |
| 10 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 132 | |
| 11 | අධ්‍යාපන අමාත්‍යාංශය | 119 | |
| 12 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 106 | |
| 13 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 100 | |
| 14 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 140 | |
| 15 | සිවිල් හා ගුවන් සේවා අමාත්‍යාංශය | 106 | |
| 16 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 125 | |
| 17 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 120 | |
| | එකතුව | | 4265 |
| | වෙනත් (100 ට අඩු) | | |
| 18 | පශුසම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 78 | |
| 19 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යාංශය | 69 | |
| 20 | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය | 48 | |
| 21 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 47 | |
| 22 | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය | 33 | |
| 23 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු | 39 | |
| 24 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 53 | |
| 25 | අධිකරණ අමාත්‍යාංශය | 38 | |
| 26 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 36 | |
| 27 | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 40 | |
| 28 | තැපැල් සේවා අමාත්‍යාංශය | 20 | |
| 29 | ඉදි කිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය | 28 | |
| 30 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 30 | |
| 31 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 22 | |

| | | | |
|---|---|---|---|
| 32 | ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යාංශය | 33 | |
| 33 | පොල් සංවර්ධන අමාත්‍යාංශය | 20 | |
| 34 | ක්‍රීඩා අමාත්‍යාංශය | 18 | |
| 35 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 20 | |
| 36 | ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය | 19 | |
| 37 | සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 20 | |
| 38 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 16 | |
| 39 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 18 | |
| 40 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 12 | |
| 41 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 15 | |
| 42 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 12 | |
| 43 | සමාජ සේවා අමාත්‍යාංශය | 13 | |
| 44 | පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය | 18 | |
| 45 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 7 | |
| 46 | රාජ්‍ය කළමණාකරන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 3 | |
| 47 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 3 | |
| 48 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 2 | |
| 49 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 2 | |
| 50 | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 5 | |
| 51 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 2 | |
| 52 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 0 | |
| 53 | මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය | 0 | |
| 54 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 8 | |
| | එකතුව | | 847 |
| | මුළු එකතුව | | 5112 |



## 8) අමාත්‍ය මණ්ඩල සංදේශ, පාර්ලිමේන්තු වාර්තා, පනත් කෙටුම්පත් පිළියෙල කිරිම, ඉදිරිපත් කිරීම හා පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම

- පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ පනත් කෙටුම්පත් ද ඇතුළුව පාර්ලිමේන්තුව හා වෙනත් ඇතැම් ආයතන වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සහ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඍජුවම ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩලයේ ලේකම් වෙත යොමු කරනු ලැබේ.

- මෙම කටයුත්තේ දී අදළ සංදේශ සහ ඇමුණුම් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සකස් කිරිමත් අමාත්‍ය මණ්ඩල තීරණ ලැබුණු පසු අදළ කාර්යාල වෙත යොමු කිරීමත් පසු විපරම් කටයුතු කිරිමත් සිදු කරනු ලැබේ.

- ගරු අග්‍රාමාත්‍යතුමා මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන වාර්තා, පනත් කෙටුම්පත් ආදිය පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත යොමු කරනු ලැබේ. මෙහිදී නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව හා අදළ අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණය කර මෙම කටයුතු ඉටු කරනු ලැබේ.

- මෙයට අමතරව අතිගරු ජනාධිපතිතුමා යටතේ පවතින ආයතන හා අග්‍රාමාත්‍ය කාර්යාලයට අදළව නගනු ලබන පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම ද අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කරනු ලැබේ. එමෙන්ම ජාතික වශයෙන් අසනු ලබන පොදු ප්‍රශ්න හා සභාව කල් තබන අවස්ථාවේ අසනු ලබන ප්‍රශ්න ද අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි.

# 9) තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන ප්‍රවර්ධනය

අග්‍රාමාත්‍ය කාර්යාලය ***ඉ– රාජ්‍ය*** ප්‍රතිපත්තියට අනුගත වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව, පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

1. තොරතුරු තාක්‍ෂණ ඒකකයක් පිහිටුවීම හා ප්‍රධාන නව්කරණ නිලධාරීන් පත් කිරීම
2. අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා ත්‍රෛභාෂික වෙබ් අඩවිය සකස් කිරීම.
3. මෘදුකාංග ආරක්ෂිත පද්ධතියක් ස්ථාපනය කිරීම
4. ගබඩා, ප්‍රවාහන, මිලදී ගැනීම්, නිලධාරීන්ගේ පැමිණීම් පිටවීම්, පුද්ගලික ලිපි ගොනු, ස්ථාවර වත්කම් යන අංශ සඳහා පරිගණක තාක්‍ෂණය යොද ගැනීම
5. කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ප්‍රායෝගික පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා අවශ්‍ය පුහුණුව ලබා දීම
6. ආයතනයේ තොරතුරු තාක්‍ෂණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඒ අනුව ක්‍රියාත්මක කිරීම
7. ප්‍රධාන නව්කරණ නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම
8. සියලුම නිලධාරීන් සඳහා පරිගණක පහසුකම් සැපයීම
9. රාජ්‍ය තොරතුරු ජාලය සඳහා ආයතනයේ සේවා සැපයීම් විස්තර ඇතුළත් කිරීම
10. සියලුම මෘදුකාංග, දෘඩාංග හා වෙබ් අඩවි සම්බන්ධ කටයුතු සඳහා බාහිර පාර්ශ්වයන් යොද ගැනීමේදී ඒ සඳහා නියමිත ගිවිසුම් අත්සන් කොට ඒවා යාවත්කාලීනව පවත්වා ගෙන යාම.


මීට අමතරව ආයතනයේ අභ්‍යන්තර පරිපාලන කටයුතු සඳහා තව දුරටත් පරිගණක තාක්‍ෂණය යොද ගැනීමට සැලසුම් කර තිබේ.

ඉහත කාර්යයන් ඉටු කිරීමට මෙම වර්ෂයේ අදල කාල පරිච්ඡේදය තුල වැය කල මුදල වගුවක් හා ප්‍රස්ථාරයක් ආශ්‍රයෙන් දක්වා ඇත.

# තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන වියදම

## (2012.01.01 - 2012.12.31)

| මාසය | මුදල (රු) |
|---|---|
| ජනවාරි | 114,152.71 |
| පෙබරවාරි | 114,152.71 |
| මාර්තු | 123,125.71 |
| අප්‍රේල් | 124,405.51 |
| මැයි | 147,633.11 |
| ජුනි | 418,031.11 |
| ජූලි | 103,871.11 |
| අගෝස්තු | 285,077.52 |
| සැප්තැම්බර් | 103,871.11 |
| ඔක්තෝම්බර් | 150,935.11 |
| නොවැම්බර් | 161,030 |
| දෙසැම්බර් | 157,537 |
| එකතුව | **2003,822.71** |



## 10) මානව සම්පත් සංවර්ධනය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන් හා සේවකයන් 61 දෙනෙකුට 2012 වසරේ දේශිය පුහුණු ලබා දී ඇත. මෙම පුහුණුවීම් ප්‍රධාන වශයෙන් පහත සඳහන් අංශ සඳහා ලබා දී ඇත.

1. ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කිරීම
2. පරිගණක තාක්ෂණික දැනුම වර්ධනය කිරීම
3. කළමණාකරණ විෂයන්හි දැනුම වර්ධනය කිරීම

❖ මීට අමතරව කාර්යාලයේ සේවකයන්ගේ දෙමළ භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ආචාර්යවරයෙකු විසින් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා මට්ටම් III සඳහා දෙමළ භාෂා පංති පැවැත්විය

❖ එමෙන්ම වසරකට වරක් පුහුණු කටයුතු වලට අදළ ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කෙරෙන අතර එහිදී විවිධ ක්‍රියාකාරකම් තුළින් කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීමට කටයුතු කෙරේ. මෙම වසරේ දී එම පුහුණු චාරිකාව බදුල්ල දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ආකල්ප වර්ධන වැඩ සටහනක් ද ඇතුලත්ව ක්‍රියාත්මක කරන ලදී.

## EXPENDITURE REPORT - From 01.01.2012 to 31-12-2012

Head-2 **Program 1 - Civil Administration** **Project 1 - Office of the Prime Minister**

| Object | Category | Estimate-2012 | 2% cut 9% cut | Total | Supplementary. Allocation | F.R.66 Transfer | Total Estimate | Total Expenditure. Up to Dec | Balance |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **RECURRENT EXPENDITURE** | | | | | | | | |
| | **Personal Emoluments** | | | | | | | | |
| 1001 | Salaries and Wages | 9,000,000 | | 9,000,000 | | | 9,000,000 | 8,775,970 | 224,030 |
| 1002 | Overtime and Holiday Pay | 2,500,000 | | 2,500,000 | | 1,000,000 | 3,500,000 | 3,348,102 | 151,898 |
| 1003 | Other Allowances | 5,000,000 | | 5,000,000 | 2,000,000 | | 7,000,000 | 6,556,764 | 443,236 |
| | **Travelling Expenses** | | | | | | | | |
| 1101 | Domestic | 1,000,000 | | 1,000,000 | | 250,000 | 1,250,000 | 1,247,721 | 2,279 |
| 1102 | Foreign | 5,200,000 | 1,000,000 | 4,200,000 | | | 4,200,000 | 3,091,061 | 1,108,939 |
| | **Supplies** | | | | | | | | |
| 1201 | Stationery and Office Requisites | 2,650,000 | | 2,650,000 | | 94,507 | 2,744,507 | 2,744,507 | 1 |
| 1202 | Fuel | 10,000,000 | | 10,000,000 | | 370,663 | 10,370,663 | 10,367,412 | 3,251 |
| 1203 | Uniforms | 200,000 | | 200,000 | | (8,400) | 191,600 | 171,644 | 19,956 |
| | **Maintenance Expenditure** | | | | | | | | |
| 1301 | Vehicles | 17,750,000 | | 17,750,000 | | (8,158,700) | 9,591,300 | 9,591,282 | 18 |
| 1302 | Plant, Machinery and Equipment | 800,000 | | 800,000 | | (250,000) | 550,000 | 478,619 | 71,381 |
| 1303 | Buildings | 1,500,000 | | 1,500,000 | | (1,003,000) | 497,000 | 142,684 | 354,316 |
| | **Contractual Services** | | | | | | | | |
| 1401 | Transport | 150,000 | | 150,000 | | 210,000 | 360,000 | 358,900 | 1,100 |
| 1402 | Postal and Communication | 2,500,000 | | 2,500,000 | | 1,748,120 | 4,248,120 | 4,248,119 | 1 |
| 1403 | Electricity & water | 4,500,000 | | 4,500,000 | | 1,000,000 | 5,500,000 | 4,568,664 | 931,336 |
| 1404 | Rents & Local Taxes | 2,000,000 | 1,500,000 | 500,000 | | (200,000) | 300,000 | 5,196 | 294,804 |
| 1405(1) | Entertainments & Gifts | 11,000,000 | | 11,000,000 | | 1,866,882 | 12,866,882 | 12,866,881 | 1 |
| 1405(2) | Other | 8,000,000 | | 8,000,000 | | 1,188,752 | 9,188,752 | 9,188,752 | 0 |
| 1405(3) | Dep.of National Botanic Gradens | 4,000,000 | | 4,000,000 | | 1,000,000 | 5,000,000 | 4,986,896 | 13,104 |
| | **Recurrent Total** | 87,750,000 | 2,500,000 | 85,250,000 | | (891,176) | 86,358,824 | 82,739,174 | 3,619,650 |
| | **Rehabilitation and Improvement of Capital Assets** | | | | | | | | |
| 2001 | Buildings & Structures | 5,500,000 | | 5,500,000 | | | 5,500,000 | 4,383,176 | 1,116,824 |
| 2002 | Plant, Machinery and Equipment | 1,000,000 | | 1,000,000 | | | 1,000,000 | 332,381 | 667,619 |
| 2003 | Vehicles | 2,000,000 | 1,000,000 | 1,000,000 | | | 1,000,000 | 156,479 | 843,521 |
| | **Acquisition of Capital Assets** | | | | | | - | | |
| 2101 | Vehicles | | | | | | - | | |
| 2102 | Furniture and Office Equipment | 5,000,000 | | 5,000,000 | | | 5,000,000 | 2,533,816 | 2,466,184 |
| 2103 | Plant, Machinery and Equipment | 1,500,000 | | 1,500,000 | | | 1,500,000 | 125,100 | 1,374,900 |
| | **Capital Total** | 15,000,000 | 1,000,000 | 14,000,000 | | - | 14,000,000 | 7,530,953 | 6,469,047 |

**Project 2 - General Administration & Establishment**

**Head - 2** **Program 1 - Civil Administration**

| Object Code | Category | Estimate-2012 | 2% 9%cut | Total | Supplemen. Allocation | F.R.66 Transfer | Total Estimate | Total Expen.. Up to Dec | Balance |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **RECURRENT EXPENDITURE** | | | | | | | | |
| | **Personal Emoluments** | | | | | | | | |
| 1001 | Salaries and Wages | 30,500,000 | | 30,500,000 | | | 30,500,000 | 30,227,518 | 272,482 |
| 1002 | Overtime and Holiday Pay | 7,200,000 | | 7,200,000 | | -304250 | 6,895,750 | 6,895,703 | 47 |
| 1003 | Other Allowances | 20,000,000 | | 20,000,000 | | 3508273 | 23,508,273 | 23,508,273 | 0 |
| | **Travelling Expenses** | | | | | | - | | - |
| 1101 | Domestic | 1,700,000 | | 1,700,000 | | -150000 | 1,550,000 | 1,543,529 | 6,471 |
| 1102 | Foreign | 1,800,000 | 714,000 | 1,086,000 | | -259750 | 826,250 | 728,148 | 98,102 |
| | **Supplies** | | | - | | | - | | - |
| 1201 | Stationery and Office Requisites | 2,300,000 | | 2,300,000 | | | 2,300,000 | 2,104,499 | 195,501 |
| 1202 | Fuel | 10,000,000 | | 10,000,000 | | -2322125 | 7,677,875 | 7,650,076 | 27,799 |
| 1203 | Uniforms | 325,000 | | 325,000 | | 8,400 | 333,400 | 325,386 | 8,014 |
| | **Maintenance Expenditure** | | | - | | | - | | - |
| 1301 | Vehicles | 7,250,000 | | 7,250,000 | | (354,000) | 6,896,000 | 6,895,174 | 826 |
| 1302 | Plant, Machinery and Equipment | 800,000 | | 800,000 | | 250,000 | 1,050,000 | 961,101 | 88,899 |
| 1303 | Buildings | 800,000 | | 800,000 | | (640,000) | 160,000 | 79,428 | 80,572 |
| | **Contractual Services** | | | - | | | - | | - |
| 1401 | Transport | 750,000 | | 750,000 | | (210,000) | 540,000 | 344,848 | 195,152 |
| 1402 | Postal & commiunication | 4,000,000 | 500,000 | 3,500,000 | | (1,200,000) | 2,300,000 | 2,033,694 | 266,306 |
| 1403 | Electricity & water | 6,000,000 | | 6,000,000 | | 1,500,000 | 7,500,000 | 6,760,123 | 739,877 |
| 1404 | Rents & Local Taxes | 300,000 | | 300,000 | | 200,000 | 500,000 | 329,375 | 170,625 |
| 1405 | Other | 3,500,000 | | 3,500,000 | | 589,628 | 4,089,628 | 4,089,628 | 0 |
| | **Transfers** | | | - | | | - | | - |
| 1506 | Property Loan Interest | 750,000 | | 750,000 | | 275,000 | 1,025,000 | 1,009,985 | 15,015 |
| | **Recurrent Total** | 97,975,000 | | 97,975,000 | | 891,176 | 97,652,176 | 2,165,687 | 95,486,489 |
| | **CAPITAL EXPENDITURE** | | | | | | | | |
| | **Rehabilitation and Improvement of Capital Assets** | | | | | | | | |
| 2001 | Buildings and Structures | 9,000,000 | | 9,000,000 | | | 9,000,000 | 3,248,299 | 5,751,701 |
| 2002 | Plant, Machinery and Equipment | 550,000 | | 550,000 | | | 550,000 | | 550,000 |
| 2003 | Vehicles | 550,000 | | 550,000 | | | 550,000 | 398,001 | 151,999 |
| | **Acquisition of Capital Assets** | | | - | | | - | | - |
| 2101 | Vehicles | | | - | 9,500,000 | 36,788 | 9,536,788 | 9,536,788 | 0 |
| 2102 | Furniture and Office Equipment | 2,750,000 | | 2,750,000 | | (36,788) | 2,713,212 | 2,191,287 | 521,925 |
| 2103 | Plant, Machinery and Equipment | 3,650,000 | | 3,650,000 | | | 3,650,000 | 112,826 | 3,537,174 |
| 2104 | Building& | | | - | | 5,000,000 | 5,000,000 | | 5,000,000 |
| | **Human Resource Development** | | | - | | | - | | - |
| 2401 | Knowledge Enchancement & Ins | 400,000 | | 400,000 | | | 400,000 | 359,505 | 40,495 |
| | **Improving Positive Attitudes of Sri lanka** | | | | | | - | | - |
| Jan-01 | Knowledge Enchancement & Ins | 40,000,000 | 5,471,000 | 34,529,000 | | (5,000,000) | 29,529,000 | 25,335,411 | 4,193,589 |
| | **Capital Total** | 56,900,000 | 5,471,000 | 51,429,000 | 9,500,000 | - | 60,929,000 | 41,182,117 | 19,746,883 |